# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2239/30 – 2021 අගෝස්තු මස 04 වැනි බදාදා – 2021.08.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අටකලන් කෝරළේ මැද පත්තුව සුළු කොට්ඨාසයේ, රක්වාන (අ.ග.පි. 699) ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක R/GDK/2018/764 හා 2019.04.30 දිනැති ප්‍රගමන අනුරේඛනයේ දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'A' – ඔරෙන්ජ් ෆිල්ඩ් වත්ත – ප්‍රමාණය: හෙක්. 0.1265

උතුරට: කැබලි අංක 25, (ආර්. ජී. දේවසුරේන්ද්‍ර සහ ර/ඇඹි රත්නාලෝක මහා විදුහල භුක්ති විඳිනු ලබන ඔරෙන්ජ් ෆිල්ඩ් වත්ත); නැගෙනහිරට: කැබලි අංක 25, (ර/ඇඹි රත්නාලෝක මහා විදුහල භුක්ති විඳිනු ලබන ඔරෙන්ජ් ෆිල්ඩ් වත්ත); දකුණට: කැබලි අංක 25, (ර/ඇඹි රත්නාලෝක මහා විදුහල භුක්ති විඳිනු ලබන ඔරෙන්ජ් ෆිල්ඩ් වත්ත); බටහිරට: කැබලි අංක 25, (ර/ඇඹි රත්නාලෝක මහා විදුහල සහ ආර්. ජී. දේවසුරේන්ද්‍ර භුක්ති විඳිනු ලබන ඔරෙන්ජ් ෆිල්ඩ් වත්ත).

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය : 4-3/8/2018/PC/209.
2021 මාර්තු මස 02 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 225


1A – G 34772 – 15 (2021/08)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.